# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 809 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 14/05/2024 පැය 0535

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - මහඔය පොලිස් වසම.

2024.05.13 වන දින දහවල් කාලයේදී මහඔය පොලිස් වසමේ සමගිපුර ප්‍රදේශයේ දෙපිරිසක් අතර ඇතිවූ ආරවුලක් දුරදිග යාම හේතුවෙන් පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදීමදීමෙන් බරපතල තත්ත්වයෙන් මහඔය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට මහඔය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ සමගිපුර, මහඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහඔය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඝාතනය සම්බන්ධයෙන් වයස අවුරුදු 18 ක් හා 23 ක් වන සමගිපුර, මහඔය ප්‍රදේශයේ පදිංචි සහෝදරයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. මහඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. දිය අනතුරකින් පුද්ගලයන් දෙදෙනෙකු බේරා ගැනීම - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය - පානදුර.

2024.05.13 වන දින සවස් කාලයේදී පානදුර වෙරළ තීරයේ දිය නෑමට ගිය පුද්ගලයන් දෙදෙනෙකු දිය වැලකට හසුවී මුහුදට ගසාගෙන යමින් සිටියදී එම ස්ථානයේ රාජකාරී යෙදී සිටි පානදුර පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත පොලිස් කොස්තාපල් 33628 ලක්මාල්, පොලිස් කොස්තාපල් 101557 ධනුක යන නිලධාරීන් හා වෙරළ ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු විසින් වහාම ක්‍රියාත්මක වී එම පුද්ගලයින් බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබා දීමෙන් පසු ඔවුන් සමඟ පැමිණි අයවළුන් වෙත භාරදී ඇත.

**මෙලෙස අනතුරට පත්ව ඇත්තේ වයස අවුරුදු 16 වියේ පසුවන අළුබෝමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් දෙදෙනෙකි.**

## 03. මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - පොතුවිල් පොලිස් ස්ථානය.

2024.05.13 වන දින උදෑසන කාලයේ පොතුවිල් පොලිස් වසමේ පොතුවිල් නගරයේදී පොතුවිල් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හඳුනා නොගත් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 20 මිලිග්‍රෑම් 350ක් හා හැස් මත්ද්‍රව්‍ය ග්‍රෑම 63 මිලිග්‍රෑම් 470ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 ත් 28ත් අතර වයස් වල පසුවන අහංගම, බූස්ස, දොඩම්දූව හා හික්කඩුව යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

පොතුවිල් පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.05.13 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ නවගම්පුර ප්‍රදේශයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 43 මිලිග්‍රෑම් 440 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන** ග්‍රෑන්ඩ්පාස් **පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.**

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - රාගම පොලිස් ස්ථානය.

2024.05.13 වන දින සවස් කාලයේ රාගම පොලිස් වසමේ වීරරත්න මාවතේදී රාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 44 ක් වන රාගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

රාගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.

2024.05.13 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ ඉහලගොඩ ප්‍රදේශයේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 360 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 58 ක් වන කඩවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.**

2024.05.13 වන දින දහවල් කාලයේ මොරටුව පොලිස් වසමේ කටුබැද්ද ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 850 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32ක් වන කටුබැද්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බුලත්සිංහල පොලිස් ස්ථානය.**

2024.05.13 වන දින සවස් කාලයේ සහ රාත්‍රී කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ පහල වෙල්ගම ප්‍රදේශයේදී බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 07 මිලි ලීටර් 500 ක් , නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 1263 මිලි ලීටර් 750ක් සමග සැකකරුවෙකු** ද පහළ නාරංගල ප්‍රදේශයේදී **නීති විරෝධී මත්පැන් ලීටර් 67 මිලි ලීටර් 500ක්** සමඟ සැකකරුවෙකු ද අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 42 යන වයස්වල පසුවන පහල නාරංගල හා බුලත්සිංහල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**09. විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාරියපොල පොලිස් ස්ථානය.**

2024.05.13 වන දින සවස් කාලයේ වාරියපොල පොලිස් වසමේ නවගත්ත ප්‍රදේශයේදී වාරියපොල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව **විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35ක් වන නවගත්ත, වාරියපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10. විදුලිසැර වැදී දැරියක් මියයාමක් - පයාගල පොලිස් වසම.**

2024.05.13 වන දින සවස් කාලයේ පයාගල පොලිස් වසමේ මග්ගොන ප්‍රදේශයේදී කුඩා දැරියකට විදුලිසැර වැදීමෙන් මියගොස් ඇති බවට ලද පණිවිඩයක් සම්බන්ධයෙන් පයාගල පොලිස් ස්ථානය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 03 ක් වන මුංහේන, මග්ගොන ප්‍රදේශයේ පදිංචි දැරියකි.**

මියගිය දැරිය නිවසේ අනාරක්ෂිත විදුලි සැපයුමක් ස්පර්ශ කිරීමෙන් විදුලි සැර වැදී බේරුවල රෝහල වෙත ඇතුළත් කිරීමේදී මියගොස් ඇති බව සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත දේහය බේරුවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධිය සම්බන්ධව පයාගල පොලිසිය විමර්ශන සිදුකරනු ලබයි.

## 11. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් -මන්නාරම පොලිස් වසම.

2024.05.13 වන දින අළුයම් කාලයේදී මසුන් ඇල්ලීම සඳහා මුහුදු ගොස් සිටි පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට මන්නාරම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මියගොස් ඇත්තේ වයස අවුරුදු 62ක් වූ පල්ලිමුනේ බටහිර, මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම පුද්ගලයා මසුන් ඇල්ලීමට ගොස් සිටියදී ඇතිවූ හදිසි කුණාටු තත්වයක් හේතුවෙන් වල්ලම පෙරළී මුහුදට ඇද වැටී ඇති අතර එම මොහොතේ මසුන් අල්ලමින් සිටි සෙසු පිරිස විසින් මෙම පුද්ගලයාගේ සිරුර සොයාගෙන ඇති අතර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය මන්නාරම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. දුම්රිය අනතුරකින් පුද්ගලයෙකු මියයාමක් - මාතර පොලිස් වසම.

2024.05.13 වන දින දහවල් කාලයේ වල්ගම අබේගුණරත්න මාවත දුම්රිය හරස් මාර්ගයේදී මාතර සිට මරදාන දක්වා ධාවනය වූ සීග්‍රගාමී දුම්රියේ යතුරු පැදියක් ගැටී එහි පැදිකරු මියගොස් ඇති බවට ලද පණිවිඩයකට අනුව මාතර පොලිස් ස්ථානය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ යටියන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යතුරු පැදිකරු විසින් අනාරක්ෂිත ලෙස දුම්රිය හරස් මාර්ගය ඔස්සේ යතුරුපැදිය ධාවනය කිරීමේදී මෙම අනතුර සිදුව ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 13. දුම්රිය අනතුරකින් පුද්ගලයෙකු මියයාමක් - කොස්ගොඩ පොලිස් වසම.

2024.05.13 වන දින සවස් කාලයේදී කොස්ගොඩ පොලිස් වසමේ දුවේමෝදර දුම්රිය හරස් මාර්ගය හරහා ධාවනය වූ අත් ට්‍රැක්ටරයක් මාතර සිට මරදාන බලා ධාවනය වූ සීඝ්‍රගාමී දුම්රියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ අත්ට්‍රැක්ටර් රථයේ රියදුරු හා එහි ගමන් ගත් පුද්ගලයෙකු බලපිටිය

රෝහලට ඇතුළත් කිරීමේදී රියදුරු මියගොස් ඇති අතර අනෙක් පුද්ගලයා වැඩිදුර ප්‍රතිකාර සඳහා කරාපිටිය රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ දෙහිගහවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - ගල්ගමුව පොලිස් වසම.

2024.05.13 වන දින උදෑසන කාලයේදී ගල්ගමුව පොලිස් වසමේ පාදෙණිය අනුරාධපුර මාර්ගයේ කුරුන්දන්කුලම ප්‍රදේශයේදී පාදෙණිය දෙස සිට අනුරාධපුර දෙසට ධාවනය වූ කාර් රථයක් එම දෙසටම ඉදිරියෙන් ධාවනය කරන ලද යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදියේ පැදිකාරිය ගල්ගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 36ක් වූ ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුර සම්බන්ධයෙන් කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - අලව්ව පොලිස් වසම.

2024.05.13 වන දින සවස් කාලයේ අලව්ව පොලිස් වසමේ අලව්ව නාරම්මල මාර්ගයේ හපුගහගෙදර ප්‍රදේශයේදී, අලව්ව දෙස සිට නාරම්මල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගය අයිනේ තිබූ කොන්ක්‍රීට් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු අලව්ව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ අලව්ව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අලව්ව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අලව්ව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**